# ඒක දේව වන්දනාව - 17 වන පාඩම

(පිටු 66,67,68 පිටු හොඳින් කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න)

(01) මතෙව් 28:19 අනුව ජේසුස් වහන්සේ තම ගෝලයන්ට ධර්මදූත සේවය පැවරීමේ දේව වාක්‍යය ලියන්න.

(02) ශුද්ධවූ ත්‍රිත්වයේ තුන්දෙනා වහන්සේලා හඳුන්වන සංකේත වෙන වෙනම ඇඳ නම් කරන්න.

(03) ශුද්ධවූ ත්‍රිත්වය පිළිබඳ අභිරහස වටහා ගැනීමට නොහැකිවූ ශුද්ධවන්තයා කවුරුද? ඊට අදාළ සිද්ධිය ලියන්න.

(04) 67 පිටුවෙහි සඳහන් පළමු ඡේදය හොඳින් කියවා පහත සඳහන් හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ ....................................... බව හා ................................ බව කරණ කොට ගෙන ඔවුන් වහන්සේ වටහා ගැනීම මිනිස් මනසට කළ නොහැකි දෙයකි.

(05)(අ) ශුද්ධ ලියවිල්ලෙන් ත්‍රිත්වික දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බවට සඳහන් අලුත් ගිවිසුමේ හා පැරණි ගිවිසුමේ අවස්ථාවන්(සිද්ධීන්) 02ක් ලියන්න.

(ආ) එම ශුද්ධ ලියවිලි පාඨ කා විසින් කාහට ප්‍රකාශ කරන ලද්දේද?

(ඇ) හිස්තැන් පුරවන්න.(ලූක් 4:5-8 ශුද්ධ ලියවිලි පාඨයෙන්)

.............................. අපට පෙන්වා දෙන්නේ ................................ හොඳින් අවබෝධ කරගෙන ................................. පමණක් වන්දනා කළ යුතු බවයි. එමෙන්ම .......................හෝ .............................. වහල් නොවී එකම ඇදහිල්ලකින් එකම ......................... පමණක් වන්දනා කළ යුතුබව ........................... තරයේ පෙන්වා දෙන සේක.

(ඈ) නික්මයාම 20:3-5 ශුද්ධවූ ලියවිලි පාඨය අනුව දෙවියන් වහන්සේගේ අණ කුමක්ද?

(06) හිස්තැන් පුරවන්න(68 පිටුවෙහි සඳහන් පළමු ඡේදය අනුව)

.............................. හි වහන්සේලා ....................සිටියත් වැඩ සිටින්නේ ........................ දෙවි කෙනෙකි. උන්වහන්සේ ත්‍රිත්වික .................................... මෙය කතෝලික................... යි. ශුද්ධවූ ත්‍රිත්වය ........................... .එය වටහා ගත හැක්කේ ........................... පමණි.

(07) 68 පිටුවෙහි දෙවෙනි ඡේදය හොඳින් කියවා පහත සඳහන් කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(අ) අප නමස්කාරය හිමි විය යුත්තේ කා හට පමණක්ද?
(ආ) පුරාණ ගිවිසුමේ නික්මයාම පොතේ සඳහන් වන දස පණතෙහි පළමුවන පනතෙහි දක්වනුයේ කුමක් පිළිබඳවද?
(ඇ) කිතුනු විශ්වාසයේ කේන්ද්‍රීය අභිරහස වනුයේ කුමක්ද?
(ඈ) දේව පුත්‍රයා මාංශ ගතවීමෙන් මනුෂ්‍යයාට පෙන්නුම් කරන්නේ කුමක්ද?
(ඉ) ශුද්ධවූ ත්‍රිත්වයේ වහන්සේලා තිදෙනාගේ සම්බන්ධතාවය කුමක්ද?
(ඊ) ශුද්ධෝත්මයාණන් වහන්සේ මෙලොවට එවන ලද්දේ කා විසින්ද?
(උ) හිස්තැන් පුරවන්න.
ශුද්ධෝත්තමයාණන් වහන්සේ ................................. හා ....................... සමඟ එකම වන්දනාවත් මහිමයත් ලබන සේක.

# පරිසරය සුරකිමු - 18 වන පාඩම (පිටු 93,94,95)

**සටහන**

01) දෙවියන් වහන්සේ, මැවිල්ලේ නිර්මාතෘවරයාණන් වන සේක. එබැවින් දේව මැවිල්ල සම්පූර්ණය. මනහරය.

02) පැරණි ගිවිසුමේ, උප්පත්ති කථාවේ මැවීම පිළිබඳ කථා දෙකකි. එම කථා දෙක අනුව දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දුන් තිළිණයකි, "පරිසරය." පරිසරය යනු මිනිසා වෙනුවෙන් මවන ලද ලෝකයේ ඇති පණ ඇති, පණ නැති සියලු දේ වන්නේය.

03) උප්පත්ති පොතේ පළමු පරිච්ඡේදය අනුව මැවීමේ පළමු කථාව තුළින් "ලෝකය හා එහි ඇති සියළු දේ මවා, උන්වහන්සේගේ සමානත්වය හා ස්වරූපය අනුව මනුෂ්‍යයාද මවා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිරී එය යටත් කරගෙන" (උප්පත්ති 1:26-28 උපුටා ගන්නා ලදී) මිනිසා විසින් පාලනය කිරීම උන්වහන්සේගේ අභිප්‍රාය විය. ඒ සඳහා උන්වහන්සේ එම මනහර පොළව හෙවත් දේව මැවිල්ල මිනිසාගේ භාරකාරත්වයට පත් කළ සේක.

මෙහි පාලනය කිරීම සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය "රාදා" වේ. එහි අර්ථය වන්නේ "සංරක්ෂණය" කිරීමය. එනම් මනුෂ්‍යයා විසින් ලෝකය සුරකිමින් සංවර්ධනය කළ යුතුය. එසේ කිරීමෙන් මිනිසා මැවීමේ කාර්යයට දායක වේ. පරිසරය සුරැකීම එහි ප්‍රධාන තැනක් ගනී.

04) මැවීමේ දෙවෙනි කථාව අනුව(උත්පත්ති 2:7 අනුව) "දෙවිසමිදාණන් වහන්සේ පොළවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු වලට හුස්ම හෙළු සේක. මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය." උප්පත්ති 2:15 අනුව "ඒදන් උයන වගා කර එය රැකබලා ගැනීම පිණිස දෙවි සමිදාණන් වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක." එම දෙවන කථාවෙන් දෙවියන් වහන්සේ මිනිසාට පහත සඳහන් වගකීම් පවරන සේක.

1)වගා කිරීම.

ඊට අදාල හෙබ්‍රෙව් වචනය වන්නේ "අබාද් " ය. එහි අර්ථය - වැඩ කරමින් නිර්මාණ කිරීමයි. එසේ කරන්නා දේව මැවිල්ල සංරක්ෂණය කරයි.

2) රැකබලා ගැනීම

ඊට අදාල හෙබ්‍රෙව් වචනය "ෂාමාර්ය" හි අර්ථය සංරක්ෂණය කිරීමයි.

මෙම කාර්යයන් දෙකේම ප්‍රතිඵලය වන්නේ මිනිසාට ජීවත් විය හැකි පරිසරයක් මෙලොවෙහි පැවතීමයි.

05) ඉහතින් සඳහන් මැවීමේ කථා දෙකෙන්ම පරිසරය සංරක්ෂණය කිරීමේ වගකීම දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට භාර කරන සේක.

අ) ඒ සඳහා සතුන්, පක්ෂීන් පෝෂණය කරමින් වැඩි වර්ධනය කරමින් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කරමින් ඔවුනට ප්‍රතිකාර කරමින් රැක බලා ගත යුතු වේ.

ආ) පොළොව, ජලය, කඳු අහස, ගස් කොළන්, එළවළු, පළතුරු, තණබිම් යනාදි සියළු දේ ආරක්ෂා කර රැකබලා ගතයුතු වේ. ගස් කොළන් වගා කළ යුතුයි.

06) දේව මැවිල්ල නොහොත් පරිසරය ආරක්ෂා නොකිරීමෙන් නැතහොත් අයුතු ලෙස පරිසරය පරිහරණය කිරීමෙන්, ගං වතුර, නියඟ, නාය යාම්, සුළි සුළං, සුනාමි, මුහුද ගොඩ ගැලීම්, ඕසෝන් ස්ථරය විනාශ වීම වැනි නොයෙකුත් පරිසර විනාශයනට මිනිසාට මුහුණ පෑමට සිදු වේ.

07) පරිසරය සුරැකීමේ හා වර්ධනය කිරීම සඳහා මනුෂ්‍යයා පහත සඳහන් කාර්යයන්හි නිරත විය යුතුය.

- සොබා දහමට ආදරය කිරීම ගරු කිරීම.
- පොළවේ සශ්‍රීකත්වය ආරක්ෂා කිරීම.
- අප ජීවත් වන පරිසරය ලස්සන කිරීම.
- පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම.
- පරිසරය දූෂණය කිරීමෙන් මිදී එය වැළැක්වීමට දායක වීම.
- සරල දිවි පෙවෙතකට හුරු වීම.
- අනාගත පරපුර වෙනුවෙන් සම්පත් ඉතිරි කිරීම.
- පරිසරය විනාශ කරන අයට එහි ප්‍රතිවිපාක පෙන්වා දීම.
- භෞතික සම්පත් වැඩි වර්ධනය කොට ආත්මාර්ථයෙන් තොරව බෙදා හදා ගැනීම.
- තමන් සතු සම්පත් බෙදා ගැනීමට අන් අය දිරි ගැන්වීම.

**<u>ක්‍රියාකාරකම්</u>**

**පිටු අංක 95 හි සඳහන් ක්‍රියාකාරකම් යටතේ ඇති ප්‍රශ්න හතරට පිළිතුරු ලියන්න.**

**17 වන පාඩම - II කොටස (පිටු අංක 68,69,70)**

(01) ත්‍රිත්වික දෙවියන් වහන්සේ තුළ වහන්සේලා නම් කරන්න.

(02) උන්වහන්සේලාගේ කාර්‍යයභාරයන් වෙන වෙනම ලියන්න.

(03) පියාණන් වහන්සේට අදාල කාර්‍යයභාරය සඳහා උත්පත්ති පොතේ සඳහන් දේව වාක්‍යයක් ලියන්න.

(04) විශ්වයේ පාලකයාණෝ කවුරුන්ද?

(05) පුත්‍රයාණන් වහන්සේ මෙලොවට වැඩියේ කුමක් අරභයාද?

(06) උන්වහන්සේ කුමන ක්‍රියා මාර්ගයක් තුළින් එය ඉෂ්ඨ කරන ලද්දේද?

(07) ඒ තුලින් මනුෂ්‍යයාට ලැබුණේ කුමක්ද?

(08) විශ්වය ශුද්ධවත් කිරීමේ කාර්‍යය හිමිවූයේ කා හටද?

(09) ප්‍රසාද ස්නාපනය ලැබූ සියල්ලන් තුළම සිදුවන්නේ කුමක්ද? කරුණු දෙකක් ලියන්න.

(10) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(අ) ප්‍රසාද ස්නාපනය ලැබූවන් ......................... වහන්සේ වැඩ වාසය කරන දේව .......................... වේ.

(ආ) ප්‍රසාද ස්නාපනය ලබන්නේ ශුද්ධ වූ ................................ නාමයෙනි.

(11) පූජාප්‍රසාදි තුමා ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී ශුද්ධවූ ත්‍රිත්වයේ වහන්සේලා සඳහන් කරන ප්‍රකාශය කුමක්ද?

(12) (අ) ප්‍රසාද ස්නාපනය පොරොන්දුවෙන් පොරොන්දු වන්නේ කුමක්ද?

(ආ) ඔබ වෙනුවෙන් දෙමව්පියන් හා ඥාන මව්පියන් පොරොන්දු වන්නේ කුමක්ද?

(13) ප්‍රසාද ස්නාපනය ලැබීමේදී ඔබ වෙනුවෙන් දෙමව්පියන් හා ඥාන මව්පියන් කුමන කරුණු විශ්වාස කරන බවට පොරොන්දු වන්නේද?(පොරොන්දු තුන ලියන්න)

(14) එම පොරොන්දු වලින් පෙන්වනු ලබන්නේ කුමක්ද?

(15) කතෝලික සභාවේ ධර්මෝපදේශයේ(ක.ස.ධ) අංක 2205 අනුව පහත සඳහන් වාක්‍ය දෙකේ හිස් තැන් පුරවන්න.

(අ) පවුලේ සාමාජිකයන් අතර ඇති එකමුතුකම ශුද්ධ .................. එකමුතුකම පෙන්නුම් කරනු ලබයි.

(ආ) දරුවන් ............හා........... මගින් දෙවියන් වහන්සේගේ ....................... කාර්යය .................... ක්‍රියාවට නගයි.

(ඇ) ක.ස.ධ. 2205 අනුව පවුල තුළ ප්‍රේමය ශක්තිමත් කරන්නේ කුමන ක්‍රියාමාර්ග තුළින්ද?(ක්‍රියාමාර්ග තුනක් ලියන්න.

(ඈ) ක.ස.බ. 2205 අනුව පවුලට පැවරෙන වගකීම් මොනවාද?

(16) ත්‍රිත්වික දෙවියන් වහන්සේ සේවාව මෙන් පවුලේද එකිනෙකාට අනන්‍ය වූ සේවා මොනවාද යන්න ඔබගේ දැන ගැනීම සඳහා පහත සඳහන් වාක්‍යයන් වලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(අ) කිතුනු පවුල........................ව/....................ව සිටිය යුතුය.

(ආ) .................මෙන් ...................ප්‍රේම කරමින් ජීවත් විය යුතුය.

පළමු පිටුව

(ඇ) ශුද්ධවූ ත්‍රිත්වයේ සිටින .................... තිදෙනා මෙන් නොබිදෙන..................../.................. ගත කල යුතුය.

(ඈ) ................. තිදෙනෙක් සිටියත් එකම..................../..................මෙන් පවුලේ ද සියළු දෙනාගේ ක්‍රියාකාරිත්වයන් ................ හා..................../............................ ඉටුකල යුතුයි.

(18) මිහිපිට ශුද්ධ වූ ත්‍රිත්වයේ සංකේතය කුමක් විය යුතුද?

(19) ශුද්ධවූ ත්‍රිත්වයේ අභිරහස ගැන පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(අ) කිතුනුවන්ගේ ජීවිතයේ කේන්ද්‍රීය අභිරහස වනුයේ ...........................

(ආ)එම අභිරහස නම් එකම...................... වහන්සේ තුල ....................... වහන්සේ...................... හා ................ .................වහන්සේ වැඩ සිටින බවත් උන්වහන්සේලා එකම ...................../...................... ලබන බවත්ය.

(20) පහත සඳහන් කරුණු යටතේ ශුද්ධවූ ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ ආදරය පෙන්විය හැකි ක්‍රියා පහ බැගින් ලියන්න.

(අ) පවුල තුළ (ආ) පාසල තුළ (ඇ) සමාජය තුළ

# එකම දෙවියන් වහන්සේ තුළ විශ්වාසයේ ජීවිතයක්

## 18 වන පාඩම (පිටු අංක 71,72,73,74)

(01) 71වන පිටුවේ 1,2,3 වන ඡේද හොඳින් කියවා හොඳින් තේරුම් ගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) 2 මකබි 7 දේව වාක්‍ය අනුව පහත සඳහන් පාඨයට නිවැරදි වචන යොදා සම්පූර්න කරන්න.
ඔබ මගේ................ සිටියත්, මම................ දුන්නත්, ......................වැඩුවත් ඔබ අයිති.................. වහන්සේට ය. ඒ නිසා නොබියව.....................ඉදිරිපත් වන්න. එවිට අප සැමට ..................... දවසේ දී........................ වහන්සේ මුණ ගැසෙයි.

(ආ) මෙම දේව වාක්‍ය අනුව යමින් ක්‍රියා කල සිද්ධියක් ලියන්න.

(ඇ) මෙම දේව වාක්‍ය අනුව දේව දරුවන් වන ඔබට(අපහට) අවධාරණය කරන්නේ කුමක්ද?

(ඈ) මිත්‍යා ඇදහිලි ගැන වාක්‍ය තුනක් ලියන්න.

(02) 71 වන පිටුවෙහි සඳහන් අවසාන ඡේදය හා ද්විතීය 12:29-31 පාඨය අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.(සමහර ප්‍රශ්නය ක්‍රම දෙකකින් සඳහන් කර ඇත)

(අ) එම පාඨය අනුව එය කා විසින් කා හට කියන ලද්දේද?

(ආ) එය කුමක් අරභයා ප්‍රකාශ කරන ලද්දේද?

(ඇ) ඒ මගින් දෙවි සමිදාණන් වහන්සේ අවවාද කරන්නේ කුමක්ද?

(ඈ) එම පාඨයේ සඳහන් <u>ඔබ හා ඔවුන්</u> යන වචන වලින් අදහස් කරන අය කවුරුන්ද?

(ඉ) අයිති කරගන්නට යන දේශය කුමක්ද?

(ඊ) එහි සඳහන් වනසා දමූ ජාතීන් කවුරුන්ද?

(උ) එහි සඳහන් පසුපස යෑමට නොරැවටෙන ලෙස යන්නෙහි තේරුම කුමක්ද?

(ඌ) ඔවුන් දෙවි දේවතාවන්ට වැඳුම් පිදුම් කළේ කෙසේද?(කරුණු දෙකක් ලියන්න)

(එ) දෙවි සමිඳාණන් වහන්සේට දිය යුතු වන්දනා සඳහා ඔවුන් කළ ක්‍රියා වලින් ඇත්වී ක්‍රියා කළ යුතු ආකාරය ලියන්න.(ක්‍රියා දෙකක් ලියන්න)

(ඒ) එසේ ක්‍රියා කලොත් සිදුවන්නේ කුමක්ද?

(ඔ) ද්වීතිය 12:29-31 පාඨය මඟින් ප්‍රකාශ කරන්නේ කුමක්ද?(ඔබේ වචනයෙන් සාරාංශ ගත කරන්න)

(03) එසකියෙල් 14:3-6 පාඨය හා ඊට යටින් සඳහන් වන ඡේදය අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) එය කා විසින් කා හට කියන ලද්දක්ද?

(ආ) එය කුමක් අරභයා කියන ලද්දක්ද?

(ඇ) එහි සඳහන් (1)මනුෂය පුත්‍රය (2) මේ මනුෂ්‍යයන් යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්ද?

(ඈ) එහි සඳහන් මනුෂ්‍යයන් දෙවියන් වහන්සේට විරුද්ධව කරන වැරැද්ද කුමක්ද?

(ඉ)මේ සම්බන්ධයෙන් (1) ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙන්නේ කාහටද?(2) කුමක් කරන අයටද? (3) ඊට පිළිතුරු දෙන්නේ ඇයි?
(4) ඒ මඟින් ස්වාමීන් වහන්සේ බලාපොරොත්තු වන්නේ කුමක්ද?

(ඊ) මෙම පාඨය ඔබේ වචනයෙන් සාරාංශ ගත කරන්න.

(04)(අ) 72 වන පිටුවෙහි සඳහන් ලෙවි 19.4 පාඨය මඟින් දෙන අවවාදය කුමක්ද?
(ආ) එම පාඨය මගින් පෙන්වා දෙන්නේ කුමක්ද?

(05)(අ) 72 වන පිටුවෙහි සඳහන් ද්විතීය 13:1-4 පාඨයෙහි සඳහන් කරුණු සාරාංශ ගත කරන්න.
(ආ) එය කුමක් අරභයා ප්‍රකාශ කරන ලද්දේද? (කරුණු 04ක් ලියන්න)
(ඇ) සමිඳාණන් වහන්සේ ඔබව පරීක්ෂා කරන්නේ කුමක් කරනවාද කියාද?
(ඈ) එසේ පරීක්ෂා කිරීම තුළ උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ කුමක්ද?

(06) පහත සඳහන් කරුණු වලට අදාලව දෙවි සමිදාණන් වහන්සේ කළ ප්‍රකාශයන්(පැරණි ගිවිසුම අනුව) ලියන්න.
(අ) බොරු දේවතාවන්ට වැඳුම් පිදුම් කරන ඊශ්‍රායෙල් ජනතාව.
(ආ) බොරු දේව රූප වලට සිත් යොමු කිරීම.
(ඇ) බොරු දේව පිළිම වලට වන්දනා කිරීම.
(ඈ) බොරු දිවැසිවරයෙකු හෝ ස්වප්න තෝරන්නෙකු හෝ පහළ වී හාස්කම් හෝ අරුම පුදුම දේ ගැන සවන් දීම.

(07) 73 වන පිටුවෙහි සඳහන් 2වන ඡේදය අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.
(අ) දේව දරුවන් වශයෙන් ඔබ අවධානය කල යුත්තේ කුමකටද?
(ආ) දෙවියන් වහන්සේට දිය යුතු තැන නොදිය යුත්තේ කුමන කරුණු සඳහා ද?
(ඇ) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.
.......................... හා .............................. දේව වලට ආදරය කළ නොහැකිය.
(ඈ) ප්‍රාණ පරිත්‍යාගිවරුන් බොහෝ දෙනෙකුට දිවි පිදීමට සිදු වූයේ ඇයි?
(ඉ) ඒක දේවවාදී විශ්වාසය යන්නෙහි තේරුම ලියන්න.
(ඊ) ඒක දේවවාදය ප්‍රතික්ෂේප කරන්නේ කුමක් මගින්ද?

(08) 73 වන පිටුවෙහි සඳහන් අවසාන ඡේදය අනුව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(අ) කතෝලික විශ්වාසයට අනුව දෙවියන් වහන්සේට අප්‍රසන්න මිත්‍යා ඇදහිලි මොනවාද?
(ආ) එදිනෙදා ජීවිතය පවතින මිත්‍යා විශ්වාස නැතහොත් දෙවියන් වහන්සේට අප්‍රසන්න ක්‍රියා මොනවාද?
(ඇ) දෙවියන් වහන්සේ විසින් ප්‍රතිකේෂ්ප කරන දේවල් මොනවාද?
(ඈ) ශුද්ධවූ බයිබලයෙන් දෙවියන් වහන්සේ බොරු දිවැසිවරුන් ගැන දෙන උපදෙස් මොනවාද?

(09) 74 පිටුවෙහි සඳහන් එකම දෙවියන් වහන්සේ තුළ විශ්වාසයේ ජීවිතයක් ගත කරමින් උන්වහන්සේට සමීප වීමට කලයුතු දෑ මොනවාද?

(10) 74 වන පිටුවෙහි සඳහන් ක්‍රියාකාරකම් (2)ට පිළිතුරු ලියන්න.

(11) 74 වන පිටුවෙහි සඳහන් ක්‍රියාකාරකම්(3) අනුව පෝස්ටරයක් නිර්මාණය කරන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයඃ කතෝලික ධර්මය

සතිය - 02

ශ්‍රේණිය 11

**Prepared by - Sunil Perera**

# පරිසරය සුරකිමු - 19 වන පාඩම (පිටු 96,97,98,99)

(01) 96 වන පිටුවෙහි සඳහන් සාමය ගැන ලියවුණු ගීතිකාව කොරස් එක සමඟ පළමු පදය තාලයට ගායනා කර කට පාඩම් කරන්න.

(02) එම ගීතිකාවෙන් ඔබේ ජීවිතයට එකතු කර ගැනීමට ආරාධනා කරන යහපත් ගුණාංග පහතින් දක්මු.

(අ) මිනිසා ජාතිය කුලය නිසා බෙදෙන්නෙ නැති මානව භක්තියෙන් එකමුතුව අප රට තුළ සමගිය ගොඩනැගීම.

(ආ) අවංක කරුණා ගුණයෙන් හා මෘදු හිතකින් යුතුව මිනිසාට සෙත සැලසීම.

(ඇ) නොයෙකුත් හේතු නිසා අසහනයෙන්,පීඩනයෙන් ජීවිත ගත කරන මිනිසාට සැනසීම දීම.

(ඈ) නැති බැරි අය හට අතහිදී මිනිසාගේ යහපත උදෙසා ඇපකැප වීම.

(03) පැරණි ගිවිසුමේ සාමය සඳහා භාවිතා කරන හෙබ්‍රෙව් වචනය <u>ෂාලෝම්</u> ය. එහි තේරුම අතුලාන්ත සාමයයි.

- ඇතුලාන්ත සාමයට (1) මූලික වන්නේ සත්‍යය(2) යුක්තිය(3) ප්‍රේමය හා (4) නිදහසයි.
- ඇතුලාන්ත සාමය ඇති කිරීමට අන් අයට හා ඔවුන්ගේ මානුෂික අයිතිවාසිකම් වලට ගරු කල යුතුය.
- යුද්ධය, ප්‍රචන්ඩ ක්‍රියා වැනි මිනිසාගේ විනාශයට හේතු වන කරුණු වලට වඩා ගැඹුරු අර්ථයක් ඇතුලාන්ත සාමය තුළ අන්තර්ගතය. ඇතුලාන්ත සාමය ඇත්නම් එවැනි විනාශකාරී දේවලින් මිනිසා සසල කල නොහැකි අතර, එවැනි විනාශකාරී දේවල් ලෝකයේ ඇති නොවේ.
- මිනිස් ජීවිත සුරුකීමට හා නාගාසිටුවීමට අවශ්‍ය වන සාමය පහත සඳහන් ක්‍රියාකර තුළින් ඇති කළ හැක.

(1) මිනිස් ජීවත් සුරුකීමට හා නගාසිටුවීමට අවශ්‍ය වන සාමය පහත සඳහන් ක්‍රියාකාර තුළින් ඇති කල හැක.

(2) අන් අයගේ අවශ්‍යථාවලදි සංවේදී වීම.

(3) අන් අයට ගරු කිරීම.

(4) සහෝදර දයාවෙන් කටයුතු කිරීම.

(04) සාමයේ කුමාරයාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට වැඩිසේ ඇතුලාන්ත සාමය ඇති කිරීමටයි. ඒ සඳහා උන්වහන්සේ පහත සඳහන් යහපත් ක්‍රියාමාර්ග වල නිරත වූ සේක.

1. පාපයෙන් විනාශ වූ දේව් මිනිස් සාමය, ජේසුස් වහන්සේගේ කුරුසියේ මරණින් ස්ථාපිත කළ සේක.
2. සාමය ඇති කරන්නේ භාග්‍යවන්තයන්,(මෙතෙව්5:9) යන භාග්‍ය ප්‍රකාශ කරමින් උන්වහන්සේ සාමය උදා කිරීමට අපට ඇරයුම් කල සේක.
3. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කරමින් පාපයන්ට සාමව දී මිනිස් හදවත් තුළ ඇතුලාන්ත සාමය උදා කිරීමට ශුද්ධ වූ සභාවට පැවරූ සේක.

(05) මිනිස් ජීවිතය සුරකිමට හා නඟා සිටුවීමට සාමය අවශ්‍ය වේ.

- සාමය වනාහි මිනිසාට ක්‍රිස්තුස් වහන්සේගෙන් ලැබුණු ත්‍යාගයකි.

ඊට(1) ඊර්ෂ්‍යාව (2) වෛරය(3) පලිගැනීම යනාදි දුර්ගුණ කිතුනු දයාවට පටහැනිය.

- එවැනි හැඟීම් අප සිත් තුළ වර්ධනය වීමට ඉඩ සැලසීම තුළින් තව කෙනෙකුට අනතුරක් කිරීමට පවා මිනිසා යොමු කරයි.(ඊට පැරණි ගිවිසුමේ එක් උදාහරණයක් නම් කයින් හා සිත තුළ තම සහෝදර

ආබෙල් කෙරෙහිකැකෑරෙමින් තිබූ ඊර්ෂ්‍යාව වෛරය, පළිගැනීම තුළ තම එක කුසයේ උපන් සහෝදරයා වන ආබෙල්ව මරා දැමීම. එය ලෝකයේ සිදුවූ පළමු මිනිස් ඝාතනයයි.

එවැනි හැඟීම් මිනිසා විසින් පාලනය කල යුතු බවට ජේසුස් වහන්සේගේ වචනය අනුව පහත සඳහන් දේ ප්‍රකාශ කල සේක.(මතෙව් 5:22)

(අ) තම සහෝදරයාට කෝප වන කෙනාට අධිකරණය යටත් වන බව.

(ආ) තම සහෝදරයාට "මෝඩයා" කියා ගරහණ කෙනාට ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වන බව.

(ඇ) ඒ තම සහෝදරයාට " ජඩයා" කියා ගරහන කවරකු වුවද ඔහු නිරාන්නට ගොදුරු වනු ඇත.

ජේසුස් ස්වාමීන් වහන්සේගේ ඉගැන්වීම් වල ප්‍රධාන තේමාව වන සතුරාට ප්‍රේම කරමින් හිංසා කරන අය වෙනුවෙන් යාච්ඤා කල යුතු බව ජේසුස් වහන්සේ මතෙව් 5:44-146 පාඨය අනුව ප්‍රකාශ කළේ කුමක්ද?

(අ) ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න.

(ආ) ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. එසේ කරන්නන්ට ලැබෙන්නේ මොනවාද?

ස්වර්ගයෙහි වැඩ සිටින අපේ පියාණන් වහන්සේ පුත්‍රයාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නාහුය. එසේ ජේසුස් වහන්සේගේ සතුරාට ප්‍රේම කරන්නට ආරාධනා කරන්නේ, උන්වහන්සේගේ

(අ) දුදනන්හට මෙන් සුදනන් හට තම ........ උදාකරන නිසා.

(ආ) ....... හට මෙන් අදමිටුවන් හටද වැසි වස්සන බැවිනි.

(06) සාමය ගොඩනැගීම සඳහා අප කල යුතු දෑ (98 පිටුව බලන්න)

(අ) (1)සාධාරණය(2) දයාව(3) දුබලයා ආරක්‍ෂා කිරීම (4) ප්‍රචන්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම(5) මිනිස් ඝාතන නොකිරීම (6) මිනිස් අයිතිවාසිකම් සුරැකීම.

(07) සාමය ගොඩනැගීම සඳහා යුද්ධය පිටු දැකිය යුත්තේ ඇයි?

(අ) යුද්ධය හා අවි ආයුධ රැස් කිරීම භයානක වේ.

(ආ) යුද්ධය සඳහා වියදම් කරන මුදල් වලින් ලෝකයේ දිළිඳුභාවය තුරන්කල හැකිය.

(ඇ) යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හා ඇතුලාන්ත සාමය ගොඩනැගීම ක්‍රිස්තියානි යුතුකම වේ.

(ඈ) අවි ආයුධ නිපදවීම හා යුද්ධ පිටු දැකීම විවිධ සංවිධාන කටයුතු කල යුතුව ඇත.

(08) අසීසියේ ශුද්ධවූ නැන්සිස් මුනිතුමාගේ සාමය වෙනුවෙන් කල යාච්ඤාව හොඳින් කියවා කට පාඩම් කර ගන්න.(පිටු අංක 98)

(09) අපි ද සාමයේ අවියක් විම සඳහා කල යුතු දේ මොනවාද?

(අ) සාමයේ කුමාරයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත් වීම තුළින් අත්දකින සාමය එකිනෙකා හා බෙදා ගැනීමට කටයුතු කිරීම.

(ආ) කරදර බාධක බොහොමයක් සහිත වටාපිටාවදී ජේසුස් වහන්සේගේ වැඩ සිටීම කෙරෙහි දැඩි විශ්වාසයකින් යුතුව ඇතුලාන්ත සාමයක් අත්දකින්නට නිරතුරුවම සුදුසු විය යුතුය.

(ඇ) ඒ සඳහා (1) සැම විටම සන්සුන්ව සිටින්න.

(2) කිසි විටෙකත් යහපතට විරුද්ධ නොවන්න.

(3) ජේසුස් බව ඇති කර ගන්න.

(4) යුක්තියට, සත්‍යයට හා සාධාරණත්වයට හිස නවන්න.

(5) ලැබුණු දෙයට ස්තුති කරන්න.

(6) දුන් දෙය අමතක නොකරන්න. ලැබුණු දෙය මතක තබා ගන්න.

(7) අන් අයට සුභාරංචිය ප්‍රකාශ කරන්න.

(10) **ක්‍රියාකාරකම් : (පිටු අංක 99 සඳහන් ක්‍රියාකාරකම් යටතේ ඇති ප්‍රශ්න 04ට පිළිතුරු ලියන්න.)**